## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## Sri Jayawardenapura Education Zone

**දෙවන වාර පරීක්ෂණය 2019** | 13 ශ්‍රේණිය
**First Term Test 2019** | **Grade 13**

**පෙරදිග සංගීතය II**
**Eastern Music II**

පැය **3.00**
**3.00 hrs**

---

උපදෙස්

**I** කොටසින් ප්‍රශ්න දෙකකට ද, **II** කොටසින් ප්‍රශ්න එකකට ද, **III** කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.( සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් ලැබේ.)

### I කොටස

**01. නිර්දේශිත රාග පහකට අයත් ස්වර සංගති කොටස් කිහිපයක් පහත සඳහන් වේ.**

**(a) සරිග, රිස, ගමග, මගරිස**

**(b) ධ නි ස , ම ගු රි ස**

**(c) ධුධුපමප, ගු, රිමප**

**(d) නිසග, (ම) රිස**

**(e) (ස) ධනිරි, රිගුරිස, ගමප**

(i) ඉහත රාගය හඳුනාගෙන අදාල ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙලින් නම් කරන්න. ලකුණු(05)

(ii) ඉහත (d) හා (e) යන රාග අතුරින් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායී කොටස තාල සංකේත සහිතව ස්වර ප්‍රස්ථාර කර ඊට අදාල තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්ථාර කරන්න ලකුණු(05)

(iii) ඉහත රාග අතුරින් රාග දෙකක් සම ප්‍රකෘති ගණයට අයත් වේ. එම රාග දෙක නම් කර, එම රාග දෙකෙහි සම විෂමතා නිදසුන් මගින් පැහැදිළි කරන්න. ලකුණු(05)

(iv) ඔබ උගත් විලම්බ ලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක ස්ථායී කොටසෙහි ස්වර ප්‍රස්ථාරය තානාලංකාර එකක් සහිතව තාලානුකූලව ප්‍රස්ථාර කරන්න ලකුණු(05)

**(02) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග පහකට අදාල ස්වර ඛණ්ඩ කිහිපයකි.**

**(a)** නිස, රිමපධ, මග,රි, ගස

**(b)** රිගුරිස, නිධපරි

**(c)** ස , රිග, සනි, පනිසරිගස

**(d)** මප, ධ නි සං, රිමං, ගුරිසං

**(e)** ගමග, රිසරි, නිනිසරිග

(i) ඉහත රාග හඳුනාගෙන අදාල ඉංග්‍රීසි අක්ෂරයද සමග පිළිවෙලින් නම් කරන්න, ලකුණු(05)

(ii) ඉහත (d) සහ (e) යන රාගයන් හි පහත සඳහන් රාග විස්තර වගු ගත කරන්න,

- රාගය
- මේලය
- ආරෝහණ
- අවරෝහණ
- මුඛ්‍යාංගය
- ජාතිය
- වාදී
- සංවාදී
- ගාන සමය
- සම ප්‍රකෘති වන රාගය

ලකුණු ( 10)

(iii) ඉහත (a) රාගයට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායී කොටසෙහි ස්වර ප්‍රස්ථාරය තාලානුකූලව ප්‍රස්ථාර කරන්න. ලකුණු ( 03)

(iv) ඉහත (c) රාගයට අයත් ආලාප ඛණ්ඩ දෙකක් ලියා දක්වන්න. ලකුණු ( 02)

**(03)** **පහත දැක්වෙනුයේ නිර්දේශිත හින්දුස්ථානී තාලයන්ට අයත් තොරතුරු වගුවකි.**

| අවනද්ධ අක්ෂරය | තාලයේ නම | මාත්‍රා ගණන | තාල සංකේත පිළිවෙල | භාවිත අවස්ථා |
|---|---|---|---|---|
| **(1)** ධ- කති‍ං -ක තා | (a).................... | (t) ……...... | x 2 0 3 | මධ්‍ය ලය ගායන/වාදන |
| **(2)** කිට ධා | (b)..................... | 12 | x 0 2 0 3 4 | (k)................ |
| **(3)** ධා තූ නා | (c)...................... | 06 | x 0 | (l)................. |
| **(4)** තූ නා | (d)..................... | 12 | x 0 2 0 3 4 | (m)................ |
| **(5)** තී නා | (e).................... | 10 | x 2 0 3 | (n)................. |
| **(6)** තා ති‍ං - | (f)..................... | 14 | x 2 0 3 | (o).................. |
| **(7)** තා ධි‍ං ධි‍ං ධා | (g).................... | 16 | x 2 0 3 | (p)................. |
| **(8)** ධා ධා ති‍ං ති‍ං | (h).................... | 16 | x 2 0 3 | (q)................... |
| **(9)** නා ධී නා | (i)..................... | 12 | x 2 0 3 | (r)................. |
| **(10)** ති‍ං නධි ධීනා | (j).................... | 06 | x 0 | (s)................... |

(i) ඉහත වගුවේ (a) සිට (t) තෙක් ඇති හිස්තැනට උචිත පිළිතුරු අදාල ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න.

ලකුණු(10)

(ii) (a) සහ (j) යන තාල දෙක සංසන්දනාත්මකව වගුවක් ඇසුරෙන් පහදන්න. ලකුණු(06)

(iii) (f) යන තාලයෙහි සමගුණ සහ දෙගුණ තාලානුකූලව ප්‍රස්ථාර කරන්න. ලකුණු(04)

## .II කොටස

**(04) පහත දැක්වෙනුයේ දේශීය ජන ගී වල මුල් ගී පාදයන්ය.**

(a) අපගෙ මුනි රාජාණන්

(b) අකුලාගෙන සොඬ කන්පෙති ලෙලවා

(c) කලුවන් කලු රුවයි මංගෝ දිළිසෙනවා

(d) සුරිඳුන් පෙර සිටන්

(e) ලේසි නොම බැඳ අල්ලා

(f) වනසා නෑයන්

(g) තුරු රත්න සිරි ලෙසිනා

(h) වැල් කොබ්බෑවල දුන්න නවාගෙන

(i) ඉහත (e) සිට (h) දක්වා ඇති ගී පාදයන් අයත් වන ජන ගී වර්ගය අදාල ඉංග්‍රීසි අක්ෂරය සමග යොදන්න.
ලකුණු(04)

(ii) ඉහත (d) ට අයත් ගී වර්ගය පිළිබඳව පහත සඳහන් නිර්ණායක ඔස්සේ විස්තර කරන්න.

- **පද්‍ය ස්වභාවය**
- **සංගීතමය ලක්ෂණ**
- **භාවිත වන අවස්ථා**
- **වාදන ලක්ෂණ**
- **වාද්‍ය භාණ්ඩ**

ලකුණු(07)

(iii) ඉහත සඳහන් (a) ගී පාදය ගැයෙන දේශීය තාලය නම් කර මුල්ගී පාදය එම තාලයට අනුව ප්‍රස්ථාර කර දක්වන්න.

ලකුණු(06)

(iv) ඉහත සඳහන් (f) ගී වර්ගය පිළිබඳ කරුණු 3ක් දක්වන්න ලකුණු(03)

05. **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(i) දේශීය තිත් ක්‍රමය ගොඩනැගෙන අයුරු විස්තර කරන්න. ලකුණු(10)

(ii) ඔබ කැමති දේශීය තිත් තාල දෙකක් නම් කර ඊට ගැලපෙන හින්දුස්ථානී තාල දෙකක් නම් කරන්න.
ලකුණු(04)

(iii) මැදුම් මහ දෙතිත නියමිත තාල සංඥා අනුව ප්‍රස්තාර කර දක්වන්න ලකුණු(06)

## III කොටස

**06. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(iv) තබ්ලා ඒකල වාදනයක ඇතුලත්වන අංග හතරක් නම් කරන්න.

ලකුණු(04)

(v) ත්‍රිතාලයට අයත්, කායදාවක් පල්ටා දෙකක් සහ තිහායි එකක් තාලානුකූලව ප්‍රස්ථාර කර දක්වන්න.

ලකුණු(10)

(iii) රාගධාරී සංගීතයේ ගායන/වාදන ශිල්ප ක්‍රම තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

ලකුණු(06)

**07. පහත සංගීත ප්‍රස්ථාර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

**(a)**




(b)

| | | | |
|---|---|---|---|
| ස - ග - | ප - ම ග | රි - ග ම | ප - - - |
| ප - ග - | ම - රි - | ග - රි - | ස - - - |

(i) ඉහත බටහිර ප්‍රස්ථාරයට අයත් ස්කේලය සඳහන් කර නියමිත සංකේතානුසාරයෙන් පෙරදිග ප්‍රස්තාර ක්‍රමයට අනුව ප්‍රස්ථාර කරන්න.

ලකුණු(04)

(ii) එහි ටයිම් සිග්නේචර් සංකතෙයන් හැඟෙන අර්තය කෙටියෙන් පැහැදිලි කරන්න ලකුණු(02)

(iii) මෙම වාදනය කුමන ගීත විශේෂයකට අයත් ද , එම ගීත ශෛලියෙ ලක්ෂණයක් සඳහන් කරන්න

ලකුණු(02)

(iv) ඉහත (b) ප්‍රස්තාරයේ ස්කේලය සඳහන් කර.එම ප්‍රස්ථාරයට අදාල 3rd හා(ර්)මනිය යොදන්න.

ලකුණු(04)

(v) එම ස්වර ප්‍රස්ථාරයට අදාල කෝඩ්ස් ඇතුලත් කරන්න. ලකුණු(04)

(vi) එම ස්වර ප්‍රස්ථාරය මධ්‍යම භාවයට හරවා බටහිර ප්‍රස්ථාර ක්‍රමයට අනුව ප්‍රස්ථාර කරන්න.

ලකුණු(04)

08. **පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් පිළිබඳ විස්තර කරන්න.**

(i) බටහිර සංගීත භාණ්ඩ වර්ගී කරණය.

(ii) ගායනයේදී වැදගත් වන ස්වරාලය.

(iii) මෙරට චිත්‍රපට සංගීතයෙහි ඇතිවූ වෙනස් කම්.

(iv) වේද ගායනා

(v) බටහිර ප්‍රසිද්ධ සංගීත නිර්මාපකයන්.

(vii) ජන ගීය

ලකුණු (05 X 04 = 20)